# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 56 — 1973 අප්‍රේල් 19 වැනි බ්‍රහස්පතින්දා — 1973.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටු | | පිටු |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... ... | 73 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | — | | |


සැළකිය යුතුයි.—(i) මෝටර් ගමනාගමන (සංශෝධන) පනත් කෙටුම්පත සහ මෝටර් වාහන (සංශෝධන) පනත් කෙටුම්පත 1973 අප්‍රේල් 11 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී, (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත 1973 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇව්ලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වාද, සෑම වරුවේ දිනවල පෙරවරු නවයේ සිට පෙරවරු එකොළහයි තිහ දක්වාද, ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරී දිනවල පස්වරු දෙක දක්වාද, වරුවේ දිනවල පෙරවරු එකොළහ දක්වාද, භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

---

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## විරෝධය දැක්වීම

**පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී.ඇම්. 7 දරණ පෝරම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.**

**ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළිගෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.**

**විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය නැතැර හැර කිරීම ද සැළකිල්ලට ගනු ලැබේ.**

---

(1) වෙළඳ ලකුණේ අංකය: 32,199. (2) ලැබුණ දිනය: 1969 දෙසැම්බර් මස 9 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): සිලෝන් ටුබැකෝ කම්පනි ලිමිටඩ් (ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරණ ලද සමාගමකි) එහි ලියාපදිංචි කාර්යාලය උතුරු ස්කිනර් පාරේ අංක 108, දරණ ස්ථානයේ පිහිටි, කොළඹ 13; සිගරට් සහ ධූම පානය පිණිස දුම්කොළ නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය: ——. (5) පන්තිය: 45. (6) බඩු: සකස් කරනු ලැබූ හෝ නොලැබූ දුම්කොළ. (7) වෙළඳ ලකුණේ සටහන:




(අ) මෙම වෙළඳ ලකුණ අංක 286, 442, 13,043 13,046, 22,997 සහ 32,201 දරණ වෙළඳ ලකුණු හා ආශ්‍රිත කරනු ලැබේ.

(ආ) මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරනු ලැබීමෙන් "No. 6" සහ "Finest Virginia" යන පාඨය සහ නිරූපණයේ ඇතුළත් විස්තරාත්මක දෑ වෙනුවෙන් තනි අයිතිය නොලැබේ.

(ඇ) මෙම වෙළඳ ලකුණ පළකරනු ලබන ගැසට් පත්‍රයේ එම නිවේදනයේ පිටපතක් නම් කරණ ලද අංක 30,468 හා 30,720 යන වෙළඳ ලකුණු අයිතිකරුවන් වෙත භාරදී ඒ බවට සාධක ඉදිරිපත් කිරීමේ කොන්දේසියට යටත්ව මෙම ලකුණ පිළිගන්නා ලදීය.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 ජූනි මස 8 දින.

4–515—1973.04.19 දින අංක 56 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගෙඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|
| අප්‍රේල් | 73.04.19 බ්‍රහස්පතින්ද | ... | 73.04.11 බදාදා | දවල් 12.00 |
| | 73.04.27 සිකුරාද | ... | 73.04.19 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| මැයි ... | 73.05.04 සිකුරාද | ... | 73.04.27 සිකුරාද | දවල් 12.00 |
| | 73.05.11 සිකුරාද | ... | 73.05.04 සිකුරාද | දවල් 12.00 |
| | 73.05.18 සිකුරාද | ... | 73.05.11 සිකුරාද | දවල් 12.00 |
| | 73.05.25 සිකුරාද | ... | 73.05.18 සිකුරාද | දවල් 12.00 |
| ජූනි | 73.06.01 සිකුරාද | ... | 73.05.25 සිකුරාද | දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද | ... | 73.06.01 සිකුරාද | දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්ද | ... | 73.06.08 සිකුරාද | දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද | ... | 73.06.14 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද | ... | 73.06.22 සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1972 ඔක්තෝබර් 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.